# වියළි කලාපිය ජීවනෝපායන් සඳහා සහාය වීමේ සහ හවුල්වීමේ වැඩසටහන

------------------------------------------------------------------------------------------------

## 1. මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 3 ඡේදයෙ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම හැර මා දරන්නා වූ මතය වනුයේ.

(අ). 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2011 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ). සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ). 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට කරන ලද ඌනපූරණයන්, ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ). ණය ගිවිසම්වල දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණය සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ). මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ). ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මූල්‍ය කාර්ය සාධනය

---------------------

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකිවූ තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂයේ වියදම සහ ඉකුත් වර්ෂයේ වියදම හා 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | විෂයයන් | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|---|
| | | 2011 | 2010 | |
| | | රු. | රු. | රු. |
| (අ). | සිවිල් වැඩ | 120,021,299 | 98,631,775 | 416,457,012 |
| (ආ). | මෝටර් වාහන හා උපකරණ | 1,825,657 | 1,426,416 | 76,333,672 |
| (ඇ). | තාක්ෂණික සහාය | 34,025,287 | 26,986,421 | 90,177,972 |
| (ඈ). | පුහුණු කිරීම් සහ වැඩමුළු | 112,497,101 | 101,889,638 | 370,956,304 |
| (ඉ). | ආරම්භක වැඩමුළු | නැත | 2,409,534 | 2,409,534 |
| (ඊ). | වර්ධක මෙහෙයුම් පිරිවැය | 95,780,960 | 82,706,679 | 399,912,525 |
| (උ). | සේවා සපයන්නන් සමග කොන්ත්‍රාත්තු | 2,002,308 | 4,052,866 | 12,240,038 |
| (ඌ). | අරමුදල් | 288,138,236 | 260,980,948 | 896,597,924 |
| (එ). | වර්ධක වාසිය | 100,000,000 | 49,499,997 | 186,049,996 |
| | එකතුව | 754,230,848 | 626,174,740 | 2,451,134,977 |

## 2.2 අග්‍රිම අරමුදල් ගිණුම

මුල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකිවූ තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය තුල අග්‍රිම අරමුදල් ගිණුමට ලැබුණු මුළු ලැබීම් සහ එයින් ආපසු ගැනීම් හා 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය පහත පරිදි විය.

| | එ.ජ.ඩොලර් | රු. |
|---|---|---|
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | 128,596 | 14,268,077 |
| එකතුකලා :- ඌන පුර්ණයන් | 4,507,917 | 500,512,290 |
| | 4,636,513 | 514,780,367 |
| අඩුකලා :- ආපසු ගැනීම් | 3,619,635 | 398,961,376 |
| විදේශ විනිමය වාසිය | - | 4,683 |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,016,878 | 115,823,674 |

## 3. විගණන නිරීක්ෂණ

--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). <u>උස්බිම් වගාව හා සත්ත්ව පාලනය</u>

I. සමාලෝචිත වර්ෂයේදී උස්බිම් වගාව හා සත්ත්ව පාලනය සංරචකය යටතේ ගොවි ක්ෂේත්‍ර පාසල් 800 ක් ස්ථාපනය කිරීමට සැලසුම්කර තිබුණු අතර ස්ථාපනය කළ ප්‍රමාණය 736 ක් විය. ව්‍යාපෘති අත්දැකීම් අනුව සෑම ගොවි ක්ෂේත්‍ර පාසලක් සඳහාම වාර්තාවක් සැකසිය යුතු වුවත් සකස් කළ බවට සාක්ෂි නිරීක්ෂණය නොවීය.

II. සමාලෝචිත වර්ෂයේ ගොවි ක්ෂේත්‍ර පාසල් පිහිටුවීම පිළිබඳ කළ නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

* මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවි සමිති 18 කට රු.1,463,000 මුදලක් පැෂන් වගාව සඳහා සහ ගොවි සමිති 21 කට රු.1,627,000 ක මුදලක් දෙළුම් වගාව සඳහා ද නිදහස්කර තිබුණත් 2011 දෙසැම්බර් 31 දින වන විටද ගොවි සමිති සමඟ ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි.

* බදුල්ල දිස්ත්‍රික් වැඩසටහන් ඒකකය විසින් බීජ නිෂ්පාදන සමිතියකට 2011 ජනි 17 දින බීජ අර්තාපල් ව්‍යාපෘතියක සඳහා ලබාදුන් රු.75,000 ක් බීජ සිටුවිය යුතු කාල සීමාවද ඉක්මවා 2011 දෙසැම්බර් 31 දක්වාම ප්‍රයෝජනයට නොගෙන ගිණුමේ පැවතුනි.

(ආ). <u>අලෙවි හා කුඩා ව්‍යාපාර සංවර්ධනය</u>

නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

I. මෙම සංරචකය යටතේ ඉදිරි වෙළඳ ගිවිසුම් 20,000 ක් ඇතිකර ගැනීමට සැලසම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානයට ඇතිකරගෙන තිබූ ගිවිසුම් ගණන 11,719 ක් විය. වැඩසටහනේ කාලය 2012 වර්ෂය අවසාන වන විට නිම කිරීමට නියමිත වුවත් ලගාකරගෙන තිබුණු ප්‍රගතිය 59% ක් පමණක් විය. ඉදිරි වෙළඳ ගිවිසුම්වල ක්‍රියාත්මක කාලය වර්ෂ 3 ක් වූයෙන් ඉතිරි 41% ක ප්‍රමාණය සම්පූර්ණකර ගැනීමට ප්‍රමාණවත් කාලයක් වැඩසටහනට නොමැති බව නිරීක්ෂණය විය.

II. මෙම සංරචකය යටතේ ඉදිරි වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක වීම අසාර්ථක වූ බැවින් එම ප්‍රතිපාදන අලෙවි පහසුකම් සැපයීම සඳහා යොදා ගැනීමට කෘෂිකර්ම සංවර්ධනය සඳහාවූ ජාත්‍යන්තර අරමුදල විසින් අනුමත කර තිබුණි. ඒ යටතේ කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන, සති පොළ ගොඩනැගිලි, සැකසුම් මධ්‍යස්ථාන 260 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණත් සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිකළ ප්‍රමාණය 148 ක් විය. ඒ පිළිබඳ නියැදි පරීක්ෂාවකදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i). කාබනික බෝග වගාව පිළිබඳ පෙර ගිවිසුම් 1,150 ක් ඇතිකර ගැනීමට වැඩසටහන විසින් සැලසුම සකස් කර තිබුණත් ඇතිකරගෙන තිබූ ගිවිසුම් සංඛ්‍යාව 100 ක් විය. මේ සඳහා රු.680,000 ක මුදලක් වැයකර තිබුණත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අසාර්ථක වී තිබුණි.

(ii). අනුරාධපුර දිස්ත්‍රික් වැඩසටහන් කළමනාකරණ ඒකකය විසින් ක්‍රියාත්මක කළ ග්ලිරිසිඩියා ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 1.7 ක් වෙන්කර තිබුණ ද රු.128,650 ක් වැය කිරීමෙන් පසු ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි.

(iii). කෘෂි නිෂ්පාදනවල අගය ප්‍රවර්ධනය කිරීම සඳහා 50 දෙනෙකු පුහුණු කිරීමට මොණරාගල දිස්ත්‍රික්කයේ වාණිජ කර්මාන්ත සහ කෘෂිකර්මාන්ත මණ්ඩලය සමඟ රු.1,668,000 ක් වටිනා ගිවිසුමකට එළඹ තිබුණු අතර මේ වෙනුවෙන් 2010 වර්ෂය තුලදී රු.136,776 ක මුදලක් ගෙවා තිබුණි. එසේ වුවද 2010 හා 2011 වර්ෂ වලදී කිසිදු කාර්යයක් ඉටුකර නොතිබුණි.

(iv). මොණරාගල දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල මී මැසි පාලන ගොවීන් 1,000 ක් ස්ථාපනය කිරීම සඳහා සේවාදායක පහසුකම් ලබා ගැනීමට ඌව මී පැණි කර්මාන්ත ආයතන සමඟ 2010 මාර්තු 02 රු.මිලියන 2 ක් වටිනා ගිවිසුමකට එළඹ තිබුණි. මේ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු.400,000 මුදලක් ගෙවා තිබුණද මී මැසි පාලන ගොවීන් 300 ක් පමණක් ස්ථාපිත කර තිබුණි. එසේ වුවද ව්‍යාපෘතිය විසින් මිලදීගත් රු.1,105,275 ක් වටිනා මී මැසි පෙට්ටි 1,125 ක්, දුම් විසුරුවන 58 ක්, මුහුණු ආවරණ 520 ක් හා පැණි නිස්සාරක 27 ක් සේවාදායක ආයතනය වෙත භාර දී තිබුණි.

(ඇ). <u>ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය</u>

ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය සංරචකය යටතේ වැඩසටහනේ 2011 වර්ෂය දක්වා ඉලක්කගත වියදම රු.මිලියන 740 ක් වුවත් තත්‍ය වියදම රු.මිලියන 646 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ වියදම රු.මිලියන 53.7 ක් විය. මේ යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු කිහිපයක් පහත දැක්වේ.

I. බදුල්ල දිස්ත්‍රික්කයේ තිස්සපනේ ප්‍රජා ශාලාව ඉදකිරීම වෙනුවෙන් රු.385,598 ක් ගෙවීම්කර තිබුණි. 2011 මැයි 30 දින ව්‍යාපෘතියේ වැඩ අවසන් කලයුතුව තිබුණ ද 2011 සැප්තැම්බර් 23 වන විටදීත් වැඩ අවසන් කර නොතිබුණි. මෙම ප්‍රජා ශාලාව ඉදිකිරීම සඳහා ප්‍රජාවගේ අවශ්‍යතා හඳුනාගැනීම් වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර මෙම භූමියට ආසන්නව දැනට අත්හැර දමා ඇති ප්‍රජා ශාලාවක්ද පැවති බව නිරීක්ෂණය විය.

II. <u>සොරණාතොට ප්‍රාදේශීය සභාව මාර්ගය ප්‍රතිසංස්කරණය</u>

ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ක්‍රියාකාරකම් යටතේ වියළි කලාපයේ දුෂ්කර ගම්මානවල ගමනාගමන පහසුකම්, අලෙවි සහ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් ග්‍රාමීය මාර්ග ඉදිකිරීම සහ වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වවත් ඊට පටහැනිව ප්‍රාදේශීය සභාවේ ප්‍රවේශ මාර්ගය ප්‍රතිසංස්කරණය සඳහා රු.327,927 ක් ගෙවා තිබුණි.

(ඈ). <u>ඉඩම් භුක්තිය පිළිබඳ ගැටලු අධ්‍යයනය</u>

කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල සමඟ 2009 අගෝස්තු 31 දින එළඹි ගිවිසුමට අනුව ඉඩම් භුක්තිය පිළිබඳ ගැටලු අධ්‍යයනයක් සඳහා රු.මිලියන 40 ක් වෙන් කර තිබුණි. අධ්‍යයන කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 14 ක් පමණක් වැයකර තිබුණි. මෙම වැඩසටහන සඳහා වූ ගිවිසුම් කාලය 2012 අගෝසතු වන විට අවසන් වන අතර එම ව්‍යාපෘතියට වෙන්කල මුදලින් රු.මිලියන 25 ක් ඉතිරි වී තිබුණි.

(ඉ). <u>නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>

වැඩසටහනේ කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 33 ට පටහැනිව කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවීම සම්බන්ධයෙන් 2008 ජූල 23 දිනැති අංක ඒඑෆ්/ඒ/ඩීඉසෙඩ්එල්එස්පී/2008/ඒකිව්/04 දරන විගණන විමසුමෙන් හා වාර්ෂික විගණන වාර්තාවලින් දිගින් දිගටම පෙන්වා තිබුණි. 2011 පෙබරවාරි 15 දිනැති අංක අමප/10/2976/536/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විමසා අදාල චක්‍රලේඛවලට පටහැනිව වැඩිපුර ගෙවා ඇති වැටුපක් වේ නම් එය අයකර ගැනීමත් ඉදිරි කාල සඳහා ප්‍රතිශෝධිත වැටුප්වලට අනුව ගෙවීම් කිරීමත් කලයුතු වුවද, වැඩිපුර ගෙවන ලද වැටුප් අදාල නලධාරීන්ගෙන් අයකර නොතිබුණි.

## 4. භෞතික කාර්ය සාධනය

විගණනයට ලබාගත හැකි වූ තොරතුරු වලට අනුව 2011 දෙසැම්බර් 31 දිනට පහත දැක්වෙන සංරචකවල ඉලක්ක කරා ළගා වී නොතිබුණි.

| | සංරචකය | 2011 වර්ෂය සඳහා ප්‍රගතිය | | 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | ඉලක්කගත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | ඉලක්කගත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව |
| (අ) | සුළු වාරිමාර්ග සංවර්ධනය | 175 | 105 | 750 | 640 |
| (ආ) | ප්‍රජා යටිතල පහසුකම් | | | | |
| i. | ජල ව්‍යාපෘති | 20 | 05 | 100 | 90 |
| ii. | ප්‍රජා ගොඩනැගිලි | 20 | 17 | 150 | 72 |
| iii. | දිළිඳුබව අවම කිරීමේ වැඩසටහන | 100 | 76 | 1,600 | 746 |
| (ඇ) | අලෙවිකරණ හා සුළු ව්‍යාපාර සංවර්ධනය | | | | |
| i. | සුළු ව්‍යාපාර | 500 | 446 | 5,000 | 1,950 |
| ii. | සෘජු පෙර ගිවිසුම් | - | - | 20,000 | 11,719 |
| iii. | අලෙවිකරණ පහසුකම් | - | - | 260 | 148 |